ශ්‍රී ලංකාවට පැමිණ සිය සේවය සපයන ලෙසට ලෝකය පුරා විසිරී සිටින සියලුම බුද්ධිමතුන්ට ආරාධනා කරන බව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ජනාධිපති මන්දිරයේදී ප්‍රකාශ කර තිබෙනවා.

එතුමා එසේ ප්‍රකාශ කළත් විශ්ව විද්‍යාලීය ශිෂ්‍ය අරගල උත්සන්න වීම, රුහුණු සරසවියේ ශිෂ්‍යයෙකු ජීවිතක්ෂයට පත් කිරීම, ලිඛිතව සහ වාචිකව දුන් පොරොන්දු වහාම ඉටු කරන ලෙසට ආණ්ඩුවට බල කරමින් විශ්ව විද්‍යාල ආචාර්යවරුන් වැඩ වර්ජනයකට ගොස් සිටීම, ආදියෙන් හෙළි වන්නේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය මුළුමනින්ම කඩා වැටී ඇති බවයි.

විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි කිරීමට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය සමග 2008 දී පැවැත් වූ සාකච්ඡාවේදී එකඟ වුණත් මෙතෙක් ඒ පොරොන්දුව ඉටු කර නැහැ.

ඒ පොරොන්දුව ඉටු නොවුණු අවස්ථාවේදී විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ඒ සම්බන්ධයෙන් බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා සමඟ ද සාකච්ඡා කළ අතර ඊට පසුව නව උසස් අධ්‍යාපන අමාත්‍ය එස්. බී. දිසානායක මහතා සමඟ ද සාකච්ඡා කළත් කිසිදු ප්‍රතිඵලයක් අත් වුණේ නැහැ.

විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට දී ඇති ලිඛිත සහ වාචික පොරොන්දු අනුව ඒ ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි කිරීම ඉතාම සාධාරණ බව එස්. බී. දිසානායක අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී ද කියා සිටියා.

සිය වැටුප් වැඩි කරන ලෙසට ආණ්ඩුවට බල කරමින් සංකේතාත්මක වැඩ වර්ජනයක යෙදුණු විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ එදින වැටුප සහ නිවාඩු කප්පාදු කිරීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ක්‍රියා කොට තිබෙනවා.

රාජ්‍ය සේවක වැටුප් රුපියල් 2500 කින් වැඩි කරන බවට පාර්ලිමේන්තු මැතිවරණයේදී සහ ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා දුන් පොරොන්දුව ද උල්ලංඝණය කර තිබෙනවා.

රාජ්‍ය සේවක වැටුප් රුපියල් 2500 කින් මේ අවුරුද්දේ දී වැඩි කිරීමට මුදල් නැතැයි කියන ආණ්ඩුව ඉදිරි අවුරුද්දේ දී හිඟ වැටුප් ද සමඟම ඒ වැටුප් වැඩි කිරීම සිදු කරන බවට ප්‍රකාශ කිරීම විහිළුවක් බව කිව යුතුයි.

ආණ්ඩුව රාජ්‍ය සේවකයන් පමණක් නොව විශ්ව විද්‍යාලීය ආචාර්යවරුන් ද රැවටීමේ යෙදී සිටින බව මේ අනුව පැහැදිලි වනවා.

විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ ප්‍රශ්නයට විධිමත් ලෙස පිළිතුරු නොදුන්නොත් ඒ ආචාර්යවරුන් විශ්ව විද්‍යාල පද්ධතියෙන් ඈත් වීමට ඉඩ තිබෙන අතර එසේ වුණොත් ඒ පද්ධතිය උග්‍ර අර්බුදකාරී තත්ත්වයකට තල්ලු වනු නියතයි.

විශ්ව විද්‍යාල මහාචාර්යවරුන්, ආචාර්යවරුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් මහ පාරට ඇද දමා ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය කරන්නේ කෙසේදැයි ආණ්ඩුවෙන් අප ප්‍රශ්න කරනවා. ශ්‍රී ලංකාව ආසියාවේ

ආශ්චර්ය බවට පත් කරන්නේ නම් විශ්ව විද්‍යාල පද්ධතිය මෙසේ බිඳ වැටීමට ඉඩ දී තිබෙන්නේ මන්දැයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගෙනුත් ආණ්ඩුවෙනුත් අප ප්‍රශ්න කරනවා.

ආණ්ඩුවේ ප්‍රධාන කාර්ය භාරය වී තිබෙන්නේ දුන් පොරොන්දු ඉටු කිරීම නොව ඒ සියලු පොරොන්දු කඩ කිරීම බව මේ තත්ත්වයෙන් මනාව පැහැදිලිවී වී තිබෙනවා.

විශ්ව විද්‍යාල පද්ධතිය සමඟ කරන සෙල්ලම වහාම නවත්වා මහාචාර්යවරුන්ගේ, ආචාර්යවරුන්ගේ සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රශ්න විසඳීමට ආණ්ඩුව වහාම ක්‍රියා කළ යුතුව තිබෙනවා.

රුහුණු විශ්ව විද්‍යාලයේ ඝාතනයට ලක් වූ ශිෂ්‍යයා සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමට වහාම කොමිසමක් පත් කරන්නැයි නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කර තිබෙන බවට ජනමාධ්‍ය ඔස්සේ කරුණු වාර්තා වී තිබෙනවා.

රුහුණු විශ්ව විද්‍යාලීය ශිෂ්‍යයාගේ ඝාතන සිද්ධිය පිළිබඳ කරුණු පොලිසිය වසන් කරන බවට චෝදනා එල්ල වී තිබෙන බව කිව යුතුයි.

පුතා තාත්තාට ලියුම් ලියා ජනතාවගේ අවධානය වෙනත් පැත්තකට යොමු කර මේ ප්‍රශ්නයෙන් ගැලවිය නොහැකි බව කිව යුතුයි. රුහුණු විශ්ව විද්‍යාලීය ශිෂ්‍යාගේ ඝාතන සිද්ධිය සම්බන්යෙන් විධිමත් සහ පුළුල් පරීක්ෂණයක් පවත්වා ඊට වගකිවයුත්තන්ට දඬුවම් කිරීමට ආණ්ඩුව ක්‍රියා කළ යුතුයි.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඉතිරි කිරීමේ ගිනුම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ගෙවූ 20% ප්‍රසාද පොලිය ජූනි මස 31 දා සිට අත් හිටුවීමට ක්‍රියා කර තිබෙන බවට ජනමාධ්‍ය ඔස්සේ කරුණු වාර්තා වී තිබෙනවා.

ශ්‍රී ලංකා මහ බැංකුව මාර්ගයෙන් 20% ක ප්‍රසාද පොලියක් ගෙවන බව කියමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගෙන් රුපියල් කෝටි ගණන් එකතු කර ගෙන අවසානයේදී පොරොන්දු වූ පරිදි ඒ පොලිය ගෙවීම අත් හිටුවමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් රැවටීම හෙළා දකිනවා.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා කටයුතු කරන බවට පොරොන්දු වී ඒ පුරවැසියන් රවටා මෙසේ අතරමං කිරීම වහාම නතර කිරීමට ආණ්ඩුව ක්‍රියා කළ යුතුව තිබෙනවා.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් අවමානයට සහ අගෞරවයට පත් නොකර සිය දූෂණ, වංචා සහ අක්‍රමිකතා අවම කරමින් පොරොන්දු වූ පරිදි ඒ පුරවැසියන්ට ප්‍රසාද පොලී දීමනාව වහාම ලබා දීමට ආණ්ඩුව ක්‍රියා කළ යුතුයි.